(c) www.sinhalalyrics.com

සඳ එළිය ගඟක් වි මා නුවන් ඉවුරේ
හැපී පෙණ පිඩු නගයි
අනේ අපි කවදාක පීනමුද ඒ ගඟේ

මල් සුවඳ රටක් වී මා නුවන් සයුරේ
ඒ රටට අඬ ගසයි
අනේ අපි කවදාක හිනැහෙමුද ඒ රටේ

කිරි සිහින සඳක් වී මා නුවන් අඹරේ
සිනාසී අත වනයි
අනේ අපි කවදාක ඇවිදිමුද ඒ සඳේ

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - සරත් දසනායක

(c) www.sinhalalyrics.com